ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/13/43

චක්‍රලේඛ අංකය : පීඑස්/සීඑස්ඒ/චක්‍රලේඛ/14/2020

2020 මාර්තු මස 19 වන දින

**සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්**
**සියලුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්**
**සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්**
**සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්**
**සියළුම රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන් / සාමාන්‍යාධිකාරීවරුන්**

**වසංගත රෝගී තත්ත්වයක් රට තුළ ව්‍යාප්ත වන අවස්ථාවක**
**රාජ්‍ය යාන්ත්‍රණය අකර්මණ්‍ය නොවී පවත්වාගෙන යාම**

ශ්‍රී ලංකාව තුළ කොරෝනා රෝගය වසංගත තත්ත්වයක් දක්වා වර්ධනය වීම වළක්වනු පිණිස කටයුතු කිරීම සියලුම රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පෞද්ගලික අංශයේ ආයතනවල මෙන්ම මහජනතාවගේ ද වගකීම වේ. කොරෝනා රෝගය රට තුළ ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා රජය විසින් මේ වන විට සියළු පියවර ගෙන ඇත.

තවදුරටත් මහජන සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම රජයේ වගකීමක් වන බැවින් සහ ජනතාව එක්රැස් වීම වැළැක්විම සඳහා ගනු ලබන පියවරක් වශයෙන් රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තුව, සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන දුරස්ථ ක්‍රමවේදයක් අනුගමනය කරමින් 2020 මාර්තු මස 20 දින සිට 27 දින දක්වා සිය කාර්යාලීය රාජකාරී ඉටු කිරිම අපේක්ෂා කරන අතර, ඉදිරියේ දී තෝරා ගත් යම් රාජ්‍ය සේවාවන් දුරස්ථ ක්‍රමවේදය යටතේ ක්‍රියාත්මක කිරීමට මෙම අත්දැකීම් පාදක කරගැනීමට ද අපේක්ෂා කෙරේ.

මෙම කාල සීමාව රජයේ නිවාඩු දින සේ නොසලකන අතර, 2020.03.21 සහ 22 දෙදින පමණක් සාමාන්‍ය රජයේ නිවාඩුවක් ලෙස බලපැවැත්වේ.

තවද, ජන ජීවිතය යථා පරිදි පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය වන්නාවූ සෞඛ්‍ය, පළාත් පාලන, ප්‍රවාහන, බැංකු, ආහාර, ජලය, විදුලිය ආදී සැපයුම් සේවා මෙන්ම පොහොර බෙදා හැරීම්, වී මිළදී ගැනීම් ඇතුළත්ව අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීම අඛණ්ඩව සිදු කිරීම සඳහා අදාළ බලධාරීන් විසින් නිසි පියවර ගත යුතුවේ. එසේම, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කටයුතු ද අඛණ්ඩව පවත්වාගත යුතුවේ.

ගාලු මුවදොර, කොළඹ 01 / காலி முகத்திடல், கொழும்பு 01 / Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones: ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax: ++ 94 11 2446657
ඊ-තැපැල / மின்-அஞ்சல் / e-mail: prsec@presidentsoffice.lk

උක්ත සඳහන් කළ පරිදි දුරස්ථ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමේ දී අදාළ ආයතන ප්‍රධානීන් විසින් හැකිතාක් දුරට තම කාර්යය මණ්ඩලය කාර්යාලය වෙත කැඳවා ගැනීමකින් තොරව, විද්‍යුත් තැපැල (e-mail), කෙටි පණිවිඩ (SMS), දුරකථන ආදී තාක්ෂණික ක්‍රමවේදයන් සහ ලිපි ගොනු ගෙන්වා ගැනීම වැනි විකල්ප ක්‍රියා මාර්ග යොදා ගනිමින් සේවාවන් අඛණ්ඩව පවත්වා ගැනීමට වග බලා ගත යුතුය.

එසේම, මහජනයා කාර්යාල වෙත එක්රැස් වීම වළක්වමින් මහජන සේවා නිසි පරිදි සැපයීම සිදු කළ යුතු බැවින් එම සේවාවන් ද දුරකථන හෝ විද්‍යුත් තැපැල (e-mail) වැනි ක්‍රමවේදයන් ඔස්සේ එකී ගැටළු විසඳීමට අවශ්‍ය පියවරයන් ගත යුතුය.

මෙහිදී තම පෞද්ගලික දුරකථන භාවිතා කිරීමේ දි වන අමතර වැය බරක් ඇත්නම් ඒ සඳහා රජය මගින් අවශ්‍ය සහන සපයනු ලැබේ.

මෙවැනි මානුෂික මෙහෙයකදී සියලුම රජයේ නිලධාරීන් අඛණ්ඩ මහජන සේවාවක් පවත්වා ගැනීම සඳහා නිසි ක්‍රමෝපායන් අනුගමනය කරමින් කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරන ලබන අතර, කොරෝනා වෛරස වසංගතයක් ලෙස ව්‍යාප්ත වීම වැළැක්වීම මුඛ්‍ය අරමුණ වන බැවින් හා විවිධ ආයතන මගින් සපයනු ලබන සේවාවන් එකිනෙකට වෙනස් වන බැවින්, සිය කාර්යය මණ්ඩලයන් දැනුවත් කොට කාර්යය මණ්ඩල සීමා කිරීම් සඳහා තම ආයතනයන් සඳහා උචිත ක්‍රමවේදයක් යොදා ගැනීම ආයතන ප්‍රධානීන් ගේ වගකීම වේ.

පෞද්ගලික අංශය ද ඉහත ක්‍රමවේදයන් තුළ සිය ව්‍යාපාර කටයුතු කිරිමට සියලුම වාණිජ මණ්ඩලවලට උපදෙස් දී ඇත.

**පි.බී. ජයසුන්දර**
ජනාධිපති ලේකම්

පිටපත : ලුතිතන් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා,
යුධ හමුදාපති / ප්‍රධානී, COVID-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය